



# අවසාන රෝස මල පිපී ඇත!

### රසික සූරියආරච්චි

මේ සීත සිසිරයේ
අවසාන රෝස මල
කොළ හැළුණු, කටු පිරුණු
රෝස පඳුරේ කොනක
දුබල අතු රිකිල්ලක
පිපී ඇත!

අවසාන රෝස මල පිපී ඇත!

ඒකාකාරිව ඔහේ ගෙවී යන ජීවිතේ
මිටට ගත් වැලි පොදකි.
සදාකාලික සතුට
කිසි දිනෙක හිරු නොදුටු සිහිනයකි

මහලු හිරු අද සවස
නොමැරුණා ද කම් නැති ය
හෙට උදේ හිරු නැවත
නොආව ද කම් නැති ය

උදාසීන ය, රළු ය, ගොළු ය හද
බදා ගත් දුක සමග නිදි ය සිත

ඒ සියලු ගැහැට මැද
රෝස මල පිපී ඇත!

අවසාන රෝස මල පිපී ඇත!

තුසර බිඳු කෙඳිරිල්ල
අගුළු ලූ සවනතට
කොවුල් නද සිහිවේ ය
වසත් උණුසුම සොයන
විඩාබර සිත වෙතට
සුසුම් වුව සරණකි ය

අවසාන රෝස මල පිපී ඇත!

# මලක අරුත

### ජයසේන කොඩිතුවක්කු

වත්තල- ශ්‍රී ලංකා

සුවඳ හමයි
හරිම හැඩයි
ගේ දොරකඩ
පාන් දරම

පෙති හතරයි
සුදුම සුදුයි
චාම් බවේ
උපමාවයි

මළහිරු බැසගෙන යද්දී
පරවී බිම වැටෙනවා
සකර දහම් අනිස යැයි
කියා දෙනව පාඩමක්

පරව ගියත් මල
සුවඳින් නැහැ අඩු
පරවුනාම සුවඳ හමන
සමන් පිච්ච මල

යහ ගුණ පිරි අය
මියැදුනාට පසු
උන් ගේ ගතිගුණ
සුවඳ හමයි ලොව

# ඩීබී---

### ආනන්ද ගුණතිලක

හොපර්ස් ක්‍රොසිං

ආදූ පටන් විසුමට ඔසි රටට වෙ      ලා
ලිපි ලේඛන ලියා හදවත් එලිය ක      ලා
ඉපදෙන මැරෙන ලෝ දහමට එකඟ වෙ      ලා
තව වියතෙකුගෙ දිවි ගමනද නතර වෙ      ලා

හොර බොරු වැඩ වලින් දම දම පලිප්      පූ
රඟ දෙන එවුන් ගැන නිතරම ඔරොප්      පූ
නිසි තැන් බලා පෑනෙන් බෙදු පරිප්      පූ
නිහඬයි ගරු මැතිඳු ඩී බී කුරුප්      පූ

මෙල්බන් වල මෙන්ම මුළු කැන්ගරු දේ      සේ
ලේඛක පිරිස ඔහු සමගිනි සහ වා      සේ
හැකි සහ නැති අයට එකලෙස මද හා      සේ
මිතුරෙකි පියෙකි - එම සෙනෙහේ නැත දෝ      සේ

තම හිත දරන නිවැරදි අදහස මත්      තේ
දිගටම ලියන්නයි ඔහු පෙරමුණ ගත්      තේ
රිදෙනා අයට රිදුනා ඒකයි සත්      තේ
නිවැරදි පාඩමයි අප හැම ගත යුත්      තේ

වියතුන් අතලොස්ස අප අත හැර යන්      න
යන විට ටිකෙන් ටික දස දෙස හිස් වන්      න
කැන්ගරු සිහල සාහිත රස අවුලන්      න
ඔහු වැඩ කලා ලේඛක රැල ගොඩ ගන්      න

අඩුවෙන් ලියන අය දුටු විට කරුණු කි      යා
දිරිමත් කලා තව තව දේ ලියන නි      යා
නවකයො දුටු තැනදි හරි සහ වැරදි සො      යා
පහදූ දුන්නු හැටි මතකයි කරුණු කි      යා

පර වෙයි හැම මලම සුවඳට හැඩට      පිපී
ඒ ලෝ දහම නිරතුරු මගෙ මනස      සිපී
පලයක් නොමැත වැලපී දැන් පොලොවෙ      හැපී
ඒ උතුමන්ට නිවනේ සුව පතමු      අපී

# 03/09/2017

### අතුල විජේවික්‍රම



පියවරුන්ගේ දිනය සමරන්න මඩමට
පුතා එනවා තෑගි හෝගත් අරගෙන
වටේ අය බලයි එහෙ මෙහෙන් එබිකම්කර
රජෙක් ආවා වගේ දැනුනා මට අද

බැලූන් බෝලද සරුව පිත්තල හැමතැන
මමත් ඇඳලා කරලා හොඳම ඇඳුමෙන් අද
ඞතාත්තට ජයයි වගෙඬ කියා පුතු කීවම
හිනාවී මමත් හිටියා මුකුත් නොකියම

හදිසියෙන් ඇවිත් පුතු කලබලෙන් විරසකින්
කථා විද්දත් කෙලින් කෙටි වදන් දෙක තුනෙන්
හිත ගැස්සිලා ගියත් වගේ පොඩි නුහුරකින්
මට මහමෙරක් පුතේ තනිකමට ඔය වැකිත්

ගියත් යන්නම් කියා පුතා මා සමුගෙන
බලාසිටියා ඈත නොපෙනෙනා තුරුවම
එදත් මගෙ පුතා පාසැල් ඇරල ලා මම
බලා හිටියේ මේ වගේ තමයි හැමදින